## 09

# ලෙව්කේ මැතිඳුන්ගේ දේශපාලන භූමිකාව පිළිබඳ අධ්‍යයනයක් (ලෙව්කේ පරපුර ඇසුරින්)

එස්.ආර්. නදීකා කුමුදිනී සිංහබාහු

ඉතිහාසය රචනා කිරීමේදී එහි ශාස්ත්‍රීය වටිනාකම තීරණය වන්නේ ඉදිරිපත් කරන්නා වූ කරුණු ප්‍රාථමික මූලාශ්‍රය මගින් සනාථ කිරීමේ හැකියාව මතය. එහෙත් ලෙව්කේ පරපුරෙහි ඉතිහාසය අධ්‍යයනයේදී ජලිඛිත,ප්‍රාථමික මූලාශ්‍රයනට වඩා ජනප්‍රවාද, ජනකථා හා ජන කවි ඇතුලු සාහිත්‍යාංගවලින් ලැබෙන පිටිබලය මූලික වන්නකි. එය එසේ වුවද ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් පරපුරක් ලෙස ලෙව්කේ පරපුර ඉතිහාසගත වනු ඇත. මෙතෙක් රචනා වූ බොහොමයක් මූලාශ්‍රයවල ලෙව්කේ පරපුර ගැන නොකියවෙන අතර ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ සමයේ පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජ්‍ය කාලය දක්වා වූ දීර්ඝ කාලය පුරාවටම ජීවත් වූ ලෙව්කේ එක් අයෙකු ලෙස දක්වා තිබේ. එමෙන්ම පසුකාලීනව උඩරට ඉතිහාසය හා මහා සටන් පිළිබඳ රචනා වූ සමහරක් මූලාශ්‍රයවල ලෙව්කේ යන නමවත් සඳහන් නොවන තරම්ය. එහෙත් ජනප්‍රවාද, ජනකථා, මෙන්ම සීමිත වූ ප්‍රාථමික මූලාශ්‍රයවලින් ලෙව්කේවරු හඳුනාගත හැකිය. ඒවායේ සඳහන් තොරතුරුත් සන්සන්දනාත්මකව අධ්‍යනය කිරීම හා ඒ ඒ සිද්ධීන් හා බැඳි කාල පරාසයන් නිවැරදිව හඳුනා ගැනීම මත ලෙව්කේ නම් එක් අයෙකු නොව කීපදෙනෙකුගෙන් සමන්විත පරපුරක් බව පැහැදිලිය. මොවුන් ස්වකීය මාතෘ භූමියත්, ආගමත් රැක ගැනීමට පරසතුරන් හමුවේ අභීතව සටන් කළ තේජෝ බල පරාක්‍රමයෙන් යුත් සිංහල වීරවරයන්ගේ නම් අතරට එක් කළ යුතු පිරිසකි.

ලෙව් (Leersiahexondra) මෙය ශාකයක නමකි. "කේ" යන්නෙන් ගහනය යන අරුත් ගෙනේ. ඒ අනුව ලෙව්+කේ යන්නෙන් ලෙව් නැමැති ගස් බහුලව වැවුණු භූමියක් ගහනය කර ගත් එසේත් නැතිනම් පදිංචිය සඳහා තෝරා ගත් බවක් අදහස් කෙරේ. කොළඹ මහනුවර මාර්ගයේ පිහිටි මාවනැල්ලට නුදුරුව ගල්බොඩ කෝරළේ එගොඩපොත පත්තුවේ ගලතරින් එහා තිබූ ලෙව්කේ ග්‍රාමය ඉහතින් අර්ථ

නිරූපණය කළ ග්‍රාමයයි. එහි පදිංචි වූ පිරිස ගමේ නමින් ලෙව්කේ පරපුර ලෙස හඳුන්වා තිබේ.

ඉපැරණි පරපුරක් ලෙස සැලකෙන මොවුන් පිළිබඳ ගෙතුණු විවිධ කතා පුවත් හමුවේ. ඒ අතර මොවුන් විජයබාහු රජුගේ යුගයේදී ඉන්දියාවේ සිට පැමිණ ලංකාවේ පදිංචි වූ බ්‍රාහ්මණ පවුලකින් පැවත එන පිරිසක් ලෙස ජනප්‍රවාදයක් පවතී. තවද ජනකවියක මෙසේ කියවේ,

දෙව්රද උපුල්වන් පෙර ලක්දිව් පැමිණි
නැව් කප්පරින් ගොඩ බට පරපුරෙන් දිනී
සිව් කෝරළේ කරවන නරවර ලෙසිනි
ලෙව්කේ මැතිඳු රජ සබයට දදක් වැනි
(ගල්අතර- කාලිදාස කවියා )

මෙම කවිය පිළිබඳව ගෙතී ඇති ප්‍රසිද්ධ වූ තවත් ජනප්‍රවාදයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ලෙව්කේ ගැන කවියක් කියන ලෙස කියූ විටදී රජ වාසල කවටයා ඉහත දූක් වූ කවිය කීවේලු (හේමපාල, නුවරඑළියේ, 2003, 24). මොවුන්ගේ ඉතිහාසය දාපුළුසෙන් රජ දක්වා දිව යයි. මොවුන් විෂ්ණු දෙවියන්ගේ දේවාලයේ ආවතේව කටයුතු වෙනුවෙන් ප්‍රධාන කපු නිලය සඳහා පැමිණි පිරිසක් බව පිළිගැනේ. නැවත යාපහුව රාජධානි සමයේ සිටි පළමුවෙනි බුවනෙකබාහු රජ දවස අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලයේ කපු නිලය සඳහා ශ්‍රී රාමචන්ද්‍ර නමින් බ්‍රාහ්මණයෙකු හා පිරිසක් පැමිණ තිබේ (අලුත්නුවර සුරේන්ද්‍ර වර්ණනාව, පුස්කොළ පොතකි, පිට 1-2). මෙම පිරිසට පදිංචිය සඳහා ලබා දී ඇත්තේ සතර කෝරළේ ලෙව්කේ ග්‍රාමයයි. මෙම පිරිස් පසුව ගමේ නමින් හඳුන්වා තිබේ. මොවුන් වංශවත් පිරිසක් ලෙස සලකා බුවනෙකබාහු රජු විසින් ඇතෙකු හා ගල්අතරින් ගමක් තෑගි කළ බවත් ලෙව් ශාකවලින් බහුල වූ ප්‍රදේශයක ඔවුන් නිවාස තනා ගත් බවත් කියවේ.

මෙලෙස ලෙව්කේ ග්‍රාමයෙහි පදිංචි වූ පිරිස් කුඹුරු අස්වද්දමින් ආර්ථිකය ශක්තිමත් කර ගත් අතර ක්‍රමයෙන් රාජ ප්‍රසාදය ලබමින් උඩරට රාජ සභාවේ නිලතල නම්බුනාම ලබා රාජ්‍ය පාලනයට දායකත්වය සැපයූ බව ජනප්‍රවාද, ජනකථා හා ලිඛිත මූලාශ්‍රයවල සඳහන් කරුණුවලින් පැහැදිලි වේ. ලෙව්කේ පරපුරෙහි අයෙකුට ප්‍රථම වරට දිසාව තනතුර හිමිවන්නේ ශ්‍රී විජය රාජසිංහ රජ දවසය ( සතර

කෝරළේ විත්තිය, 1964,78). මෙසේ හිමිවූ සතර කෝරළේ දිසාව හට රාජ්‍ය පාලනයේදී විශේෂ ස්ථානයක් හිමි විය. ඒ පිළිබඳ කියවෙන ජන කාව්‍යයකි.

කොඩියකුත් රතු බැඳපු සවරන් සදන යුදයට පෙරමුණේ
කොතවියක් සහ පච්ච ලන්සෙ දවුන්ඩයකුත් සමගිනේ
කොඩියකුත් සහ පිහිටි ඉර හඳ මාන පස මේ සමගිනේ
මෙම සිරිත් ඇති සතර කෝරළේ දිසාවේ යති පෙරමුණේ
බෙල්,එච්.සී,පී,2004,242 )

ලෙව්කේ රාළහාමි, ලෙව්කේ විජයසුන්දර රාජකරුණා සෙනවිරත්න හේරත් මුදියන්සේ හා ලෙව්කේ විජේවර්ධන රාජකරුණා සෙනවිරත්න හේරත් මුදියන්සේ නමින් ලෙව්කේවරුන් කිහිපදෙනෙකු විසූ බව උඩරට රාජ්‍ය සමයේ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගත හැකිය.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ සමයේ කියවෙන ලෙව්කේ පරපුරේ පළමුවැන්නා ලෙව්කේ රාළහාමිය. මොහු ලෙව්කේ විජයසුන්දර රාජකරුණාගේ පියාය. සරණංකර සංඝරාජ හිමියන්ට තරුණ සාමණේරනමක්ව සිටියදී බාලාවතාරය හා පාලි ව්‍යාකරණ ඉගැන්වූයේ මොහුය (වාචිස්සර හිමි, 1964, 156-159). ඒ අනුව සරණංකර හිමියන්ගේ ගුරුවරයෙකු ලෙස ලෙව්කේ රාළහාමි දැක්විය හැකි අතරම සමකාලීනව සිටි උගතුන් අතළොස්ස අතරට මොහුගේ නම ද එක් වන බව ද කිව යුතුය. මුලදී වටබුළුවේ මහතෙරුන්ගේ ශිෂ්‍යයෙකුව සිටි මොහු විහාරේ රාළහාමි යන නමින්ද හැඳින්වීය( බණ්ඩා,ජී.ආර්,"-",37). එයට හේතු වූයේ මොහු මහනුවර පෝයමලු විහාරයේ මහණව සිට පසුව සිවුරු හළ කෙනෙකු වීමයි. සරණංකර හිමියන් ලෙව්කේගෙන් ඉගෙන ගන්නේ මාකෙහෙල්වල සිරගතකොට සිටියදීය.

ලෙව්කේ රාළහාමි සිරගතකොට තැබීම පිළිබඳව ගෙතී ඇති ජනප්‍රවාද විවිධාකාර වේ. ඒ අතර පිළිගත හැකි ජනප්‍රවාදය වන්නේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ රාජ සභාවේ සිටි ගස්කොන් මැරවීමට කුමන්ත්‍රණය කිරීමේ වරදට හසුවී සිරගතකොට තැබූ බවය. (වාචිස්සර හිමි, 1964, 266). නරේන්ද්‍රසිංහ රජුගේ අන්තඃපුරය දූෂණය කිරීමේ වරදට රජු විසින් ගස්කොන් හා කීපදෙනෙකු මරා දැමීය. මේ වන විට ගොන්සාල්වෙස් පියතුමා හා ගස්කොන් රජුගේ හොඳ හිත දිනාගෙන තිබීම එයට හේතු විය. එය ඉවසුම් නොවූ සංඝරාජ

හිමියන්ගේ ආචාර්ය වූ සූරියගොඩ හිමියන් ඇතුලු පිරිසක් විසින් කළ කුමන්ත්‍රණය මත රජු ගස්කොන්ට විරුද්ධ විය. එහෙත් එම කුමන්ත්‍රණය සැලවීමෙන් පසුව සූරියගොඩ හිමියන් ඇතුලු කිහිප දෙනෙකු රජු විසින් සිරගත කොට තබා මරා දමන ලදී. මෙම කුමන්ත්‍රණයට ලෙව්කේ ද සම්බන්ධ අයෙකු බව පෙනෙනුයේ ගස්කොන් විසින් රජුගෙන් සමාව අයැදමින් ලියූ නෝක්කාඩුමාලය තුලිනි.

මීට උපා බස් නොකියන් ලඳ මට අණ කරයි
කාට කියා සැනසෙම්දෝ ලඳ ලිය මට දුකයි
බොහෝ කලක් ලඳ අප මැරුවේ මරුවා තමයි
තුන්යම පසුකර ලෙව්කේ බණ්ඩාරට කියයි
(නෝක්කඩුමාලය/සතර කෝරළේ ජනප්‍රවාදයකි)

මෙම කාව්‍ය රචනය රජු වෙත එවූවද අතරමගදී සතුරා අතට පත් වූ බැවින් ගස්කොන් තමාගෙන් සමාව අයැදීම පිළිබඳව රජු දැන නොගනී. ඒ නිසාවෙන් පෙර තීන්දු කළ පරිදි ගස්කොන්ගේ හිස ගසා දැමීමට නියෝග කළේ ලෙව්කේ හටය. ගස්කොන් රජුගෙන් සමාව අයැදි බව සැලවූයේ පසුවය. එය වසන් කළේ ලෙව්කේ යැයි චෝදනා ලැබීම නිසා එම වරදට ලෙව්කේ මාකෙහෙල්වල සිරකර තැබූ බව ජනප්‍රවාදයේ එයි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම කුමන්ත්‍රණයට හසු වී මාකෙහෙල්වල සිරගත කොට තිබියදී සරණංකර හිමියන් බාලාවතාරය හා සතිපට්ඨාන සූත්‍රය ඉගනීමට පැමිණි බවයි. ලෙව්කේගෙන් උගත් දේ සරණංකර හිමියන්ට කොතෙක් වටින්නේදැයි දැක්වීමේදී සරණංකර හිමියන් අවස්ථා කිහිපයකදීම ලෙව්කේ සිහිපත් කොට පින්පෙත් පැමිණ වූ බව ප්‍රකට කරයි.

ලෙව්කේවරුන් අතර වඩා වැදගත් වූවෙකු වන්නේ පළමුවන ලෙව්කේ දිසාවය. මොහු නමින් ලෙව්කේ විජයසුන්දර රාජකරුණා සෙනවිරත්න හේරත් මුදියන්සේ නම් විය. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ අවසන් රාජ සමයේ දී හමුදාවේ සේනාධිපති ධූරය හෙබවූයේ මොහුමය. මොහු මල්ලව පොර ශූරයෙකු ලෙස ප්‍රසිද්ධ වූ අයෙකි. ඒබ බව සනාථ කරන ජනකථා බොහොමයක් සතර කෝරළය ප්‍රමුඛ කෑගලු ජනයා අතර ප්‍රසිද්ධව තිබේ. එබඳු ජනප්‍රවාද අතරින් එකක් මෙසේ දැක්විය හැකිය.

හැට බානකින් සීසාන්නට වීම ලෙව්කේට අගෞරවයක් විය. මෙය ඉවසිය නොහැකිව ගම්මනීට නියර පිට පුටුවක වාඩි වීමට සලස්වා ලෙව්කේ හරකුන් තිස් බානම ඇය යටකරගෙන ගිය බවට ජනප්‍රවාදයක් පවතී. ( කැගලු විත්ති,2002,62-63 ).

මේවායේ සත්‍ය අසත්‍ය බව කෙසේ වෙතත් ඒවා අතිශයෝක්තියට බරව නිර්මාණය වී ඇති බව පැහැදිලිය. මේ සියලු කතාවලින් ලෙව්කේ ප්‍රබල කාය ශක්තියක් ඇත්තෙකු බව ඇඟවීම අරමුණු වන්නට ඇත.

දෙවන විමලධර්මසූරිය රජුගෙන් පසු රජ බවට පත් වූයේ කුණ්ඩසාලේ කුමරු ය. මොහු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ නමින් රජ විය. මෙම රජු නායක්කාර් වංශික කුමාරිකාවක් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා බිසෝ බැව්හි තැබීමත් සමඟ නායක්කාර් පරපුරේ බලපෑම උඩරට රාජ සභාවට බලපෑම් කිරීම වර්ධනය විය. ඒ හේතුව මත ජාතිහිතෛෂී රදළවරු සිංහල රාජවංශය රැක ගැනීමට උත්සුක වූහ. මේ වන විට පළමුවෙනි අදිකාරම් ධූරය දැරුවේ ඇහැලේපොළ පරපුරේ කෙනෙකි. ඔහු තම බලය හා ප්‍රතාපවත් බව රැක ගැනීම උදෙසා ආගන්තුක පාලකයෙකු රජ වීම කෙරේ පක්ෂපාතී වූ අයෙකි. දකුණු ඉන්දීය වඩුග පරපුරට උඩරට රාජ්‍ය අත්වීම වළක්වාලීමේ පුරෝගාමියා වූයේ ලෙව්කේ රාළය. මොහු හමුදාවේ සේනාපති ලෙසද ක්‍රියා කර තිබේ. නරේන්ද්‍රසිංහ රජුට අග බිසවගෙන් පුතුන් නොලද නිසා ඔහුගේ බිසවගේ සහෝදරයෙකුට රජ උරුමය දීමට රජු හා ඇහැලේපොළ තීරණය කරනු ලැබිණි. එහෙත් සිංහල රජ පරපුර රැක ගැනීමට නරේන්ද්‍රසිංහ රජුගේ යකඩ දෝලියකට ලද උනම්බුවේ කුමාරයාට රජකම ලබාදීමට ලෙව්කේ උත්සහ කෙරිණි (Gideon, Joan, 1935,3). එහෙත් එම උදාර අදහස ව්‍යර්ථ වූයේ සිංහල රාජත්වයට කණ කොකා හඬලමිනි. මින් පසුව නායක්කාර් වංශික ශ්‍රී විජය රාජසිංහ රාජත්වයට පත් විය.

එහෙත් අකමැත්තෙන් වුවද ඉන් පසු රජ වූ ශ්‍රී විජය රාජසිංහ රජුගේ සිත් දිනා ගත් ලෙව්කේගේ උපායශීලීත්වය හා වැදගත්කම වටහාගත් රජු විසින් තුන් හා හතර කෝරළේ දිසාවේ තනතුර ලෙව්කේ හට පිරිනමා තිබේ. මේ වන විට දෙවන අදිකාරම් වූයේ පිළිමතලාවේය. ඇහැලේපොළ හා පිළිමතලාවේ ඉතා සමීපතමයන් විය. එහෙත් ලෙව්කේ මොවුන්ගේ ප්‍රධාන විරුද්ධවාදියා විය. එය අවියක් කර ගත්

රජු විසින් ඇහැලේපොළගේ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ලෙව්කේ යොදා ගැනිණි. රජු මුලින්ම අදිකාරම්වරුන්ගේ බලය තමාට තර්ජනයක් වෙතැයි සිතා අදිකාරම්වරුන්ගේ ප්‍රතිවාදියෙකු මෙන්ම ලෙව්කේගේ ඥාතියෙකු වූ සමනක්කොඩිට දෙවන අදිකාරම් ධූරය පිරිනැමීය. මේ සමඟ රදළ ප්‍රධානීන් අතර මතභේද උත්සන්න වන්නට විය.

උඩරට හා කොළඹ අතර පැරණි ප්‍රධාන මාර්ගය සතර කෝරළය මැදින් වැටී තිබුණි. එමෙන්ම උඩරට රාජධානියට පිවිසෙන මුර කපොල්ල වූ බලන කපොල්ල පිහිටියේද එහිමය. එහි ආරක්ෂකයා මෙන්ම භාරකරු වූයේ සතර කෝරළේ දිසාවයි. බලන කන්දේ දුල් වූ ගින්නකින් සතුරා රන බව රජු දැන ගනී. රජුගේ මෙන්ම රජ මාලිගයේත් දළදා මාලිගයෙහිත් මුළු රාජ්‍යයෙහිම ආරක්ෂාව භාර දෙනු ලැබුවේද බලන කපොල්ලෙහි ආරක්ෂකයාටමජය. එබැවින් සතර කෝරළේ දිසාවේ තනතුර රජුගේ සමීපතම වූද විශ්වාසවන්ත වූද උගත් කාය ශක්තියෙන්ද අනූන වූ අයෙකුට පිරි නැමීම සාමාන්‍ය සිරිත විය. ඒ අනුව මෙම නිලය ලෙව්කේ හට ලබා දී ඇත්තේ ඔහු මෙම සියලු සුදුසුකම්වලින් පරිපූර්ණ වූවෙකු බැවිනි. ලෙව්කේ බාහිර සතුරු බලවේග හමුවේ නොසැලී මුහුණ දෙමින් රාජ්‍ය ආරක්ෂා කළ හැකි අයෙකු යන විශ්වාසය රජු තුල තිබෙන්නට ඇත.

තවද ලන්දේසීන් හා රජු අතර ලිපි ගණුදෙණු සිදු වූයේද සතර කෝරළ දිසාවේ හරහාය(දේවරාජ,ලෝනා,අබයසිංහ හා තවත්,1977,89-92). එහෙයින් මොහුගේ විශ්වාසනීයත්වය වඩාත් වැදගත් වූයේ ලන්දේසීන් පිළිබඳ ප්‍රතිපත්ති සැකසීමේ නිදහස ද ඔහු සතුව පැවති නිසාය.

ශ්‍රී විජය රාජසිංහ රජු බලයට පත් වූ පසුව පළවෙනි ලෙව්කේ දිසාව හා ඌවේ දිසාව ලෙස පත් වූ පසු ලෙව්කේ ග්‍රාමය හැරුණු කොට මාදල, හැලමඩ හා යටපාවල යන ගම් නින්දගම් ලෙස හිමි වී තිබේ. මෙය තඹ සන්නසක් මගින් ප්‍රධානය කර තිබේ. එය දිගින් අඟල් 15 කින් හා පළලින් අඟල් 4 කින් යුක්ත වූවකි. එහි ශ්‍රී ඉර හඳ හා සිංහ, ව්‍යාඝ්‍ර කැටයම් සහිතව රිදී දාරයකින් අලංකාර වූවක් බව ඉතිහාසය හා පුරාවිද්‍යාව පිළිබඳ පර්යේෂණවල නිරත වූ හේරත් චන්ද්‍රරත්න හා උපතිස්ස බණ්ඩාර යන මහත්වරුන් සඳහන් කෙරිණි. මෙලෙස බදුවලින් හා රාජකාරියෙන් තොර පරවේණි ඉඩම් සමූහයක් ලබා දීමට කෘතගුණ

දැක්වීමක් ලෙස ක්‍රි.ව 1745 දී පමණ ලෙව්කේ විසින් කැටයම්වලින් යුක්ත වූ රෝද දෙකක් මත නංවන ලද කාල තුවක්කුවක ආකෘතියක් තනවා පිරි නැමූ දිනය ද ඒ මත කොටා රජු හට පරිත්‍යාග කර තිබේ. ක්‍රි.ව 1765 දී ලන්දේසී හමුදා මහනුවර ආක්‍රමණය කළ අවස්ථාවේ ලෙව්කේ විසින් පිරිනමන ලද කාලතුවක්කුවත් තවත් භාණ්ඩ කිහිපයක් රජු විසින් ඉතිරි කොට තබා ගොස් තිබියදී සොයා ගෙන තිබේ. මෙම කාලතුවක්කුව ලන්දේසී ආණ්ඩුකාරයා වූ බැරන් වැන් එකි විසින් නතු කර ගෙන තිබේ. පසුව ඔහු විසින් බැරන් බ්‍රාන්ස්වික් මගින් ඕලන්දයේ රජු වූ V වන විලියම් වෙත යැවූ බවත් කියවේ. එය දැනට ඕලන්දයේ රික්ස් කෞතුකාගාරයේ ප්‍රර්ශනයට තබා ඇත. (De Silva,1976,375-376). එහි ආකෘතියක් කොළඹ ජාතික කෞතුකාගාරයේ ජේ.ආර් ජයවර්ධන කේන්ද්‍රයේ ප්‍රදර්ශනයට තබා තිබේ. මෙම ලෙව්කේ විවාහ වී සිටියේ දෙවන රාජසිංහ රජ සමයේ තුන් කෝරළේ හා සතර කෝරළේ දිසාව වූ ඒදඬුවේ රාළගේ දියණියක් සමගිනි.

ශ්‍රී විජය රාජසිංහගෙන් පසුව රජපත් වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුය. මෙම රජුගේ සමයේදී එනම් 1751 දී ලෙව්කේගේ මරණය සිදු වූ අතර ඉන් පසු තුන් හා හතර කෝරළේ දිසාවේ තනතුර මීගස්තැන්නේ (දුම්බර රාළහාමි) හට ලබා දී තිබේ. ලෙව්කේ මැතිඳුන්ගේ ජාතිහිතෛෂිභාවය කෙතෙක්වීද යත් " ඉතා බලසම්පන්න වූ මේ තිලමේගේ මරණය දෙමළ කුමාරවරුන්ට සිංහල රාජ්‍ය තහවුරු කර ගැනීමට අතිශයින් උපකාරී විය" වශයෙන් රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් සඳහන් කර තිබීමෙන්ම පැහැදිලි වේ( සිද්ධාර්ථ හිමි,1936,32). සිංහල රාජ්‍ය රැක ගැනීම උදෙසා දැක් වූ අපමණ වූ දායකත්වය මෙබඳු ප්‍රකාශයක් කිරීම සඳහා හේතුවන්නට ඇත.

මෙම ලෙව්කේ දිසාවගෙන් පසුව ඔහුගේ පුත්‍රයා වූ රාජවර්ධන කරුණා සෙනවිරත්න හේරත් මුදියන්සේ පිළිබඳව ඉතිහාසයේ කියවේ. මොහු පල්ලේගම් පහේ අදිකාරම්ගේ ඥාතියෙකු ද විය. ශ්‍රී වික්‍රම රාජසිංහගේ හිතවතෙකු වූයෙන් ඌවේ දිසාව ලෙස පත් කර තිබේ. ( De Silva,1989,85). පසුව වැදගත් දිසා වන්නියක් වූ සතර කෝරළේ මහ දිසාව ලෙස පත් කෙරිණි. ඒ වන විට එම ප්‍රදේශය දෙවන අදිකාරම් වූ මීගස්තැන්නේ සතුව පැවති අතර ඔහුට මෙතැන් සිට ඌව පවරන ලදී.

මොහු ද මල්ලවපොර ශූරයෙකු ලෙස කියවෙන අතරම මොහුගේ ශක්ති සම්පන්න හා ආරෝහ පරිනාහ දේහ සම්පත්තිය දක්වීම සඳහා ගෙතුණු ජනකතා හා කවි සතර කෝරළේ සාහිත්‍යයේ හමු වේ. මෙය ගල්අතර විසූ කාලිදාස නම් කවියාගේ නිර්මාණයකි.

ඉද ගත්තම පිළිමය තිබ්බා වාගෙයි
නැගිටපුහම වේපත බැන්දා වාගෙයි
යන එන ගමන් විදුලිය කෙටුවා වාගෙයි
ලෙව්කේ මැතිඳු ගත් අතරට කොත වාගෙයි

මොහු මල්ලව පොර ශිල්පය මැලේ ජාතිකයෙකු වූ කපිතාන් අසානා මොහොන්දිරම්ගෙන් උගත් බව කියවේ. තවද ලෙව්කේ ශරීරයේ පිහිටි නිලවලට ඇඟිල්ලෙන් ඇණ මැරීම හා අඩපණ කිරීමටද හැකියාව ඇත්තෙකු බව කියවේ. මොහු පිළිබඳව ද ගෙතුණු ජනප්‍රවාද මත ඔහුගේ කාය ශක්තිය මතු කරයි.

වරෙක ඉංග්‍රීසින් ඔහු ගමන් කළ මාර්ගය අවහිර කරන ලද්දේ කාලවතුවක්කුවක් හරස් කරමිනි. ඔහු එය පාදයෙන් ඉතා පහසුවෙන් තල්ලු කොට ඉවත් කළා යැයි කියවේ (Lewis J.P,1968,181). මහනුවර මහමළුවේ වසරකට වරක් සංදර්ශනයක් පවත්වයි. එහිදී ඇත් දළයක් වළලා එය සෙවීමට කියන අතර එය සෙවීම සාමාන්‍ය මනුෂ්‍යයෙකුට පහසු කාර්යයක් නොවීය. එහෙත් ලෙව්කේ ඉතා පහසුවෙන්ම දළය සොයා ගනු ලැබේ. තවද කඩු තුඩෙහි හුණු ස්වල්පයක් ගා තවකෙකුගේ නාසය ළඟින් කඩුව වේගයෙන් යැවීම වැනි දක්ෂතා වූ බව කෑගලු ජන සාහිත්‍යයේ විස්තර කරයි. (දූරණියගල,ප.එ.ප,2005,8-10).

1800 පමණ වන විට ලෙව්කේ රාජ සභාවේ ප්‍රබලයෙකි. ඒ වන විට මහ අදිකාරම් වූයේ පිළිමතලාවේ අයෙකි. මොහු නෝර්ත් ආණ්ඩුකාරයා සමඟ රහස්‍ය ගිවිසුම් මගින් සාකච්ඡා පවත්වා තිබේ. මන්ද ඔහුට අවශ්‍ය වූයේ සිංහලයෙකු සිංහාසනාරූඪ කිරීම හෝ තමාම රජු ලෙස පෙනී සිටිමින් තම බලය ආරක්ෂා කර ගැනීමයි. මෙම රහස් ගිවිසුමට අනුව උඩරට පාලනය අදිකාරම් අතට පවරා දී උතුම් කුමාරයා නමින් හැඳින්වීමටත් මුත්තුසාමි යාපනේ රජු ලෙස පත් කිරීමටත් ශ්‍රී වික්‍රම

රාජසිංහ රජකමෙන් ඉවත් කොට ඉංග්‍රීසීන්ට අයත් පළාතක පදිංචි කරවීමටත් විශ්‍රාම වැටුප් ගෙවන තත්ත්වයට ඔහු පත් කර ඒ සඳහා වැය පියවීමට උඩරටින් පුවක් අමුණු 20000ක් වාර්ෂිකව ඉංග්‍රීසි ආණ්ඩුවට ගෙවීමටත් ගිවිස ගත් බවත් කියවේ(කරුණාතිලක,ඒ.ඩී.පී,2008,128). එහෙත් මෙම කුමන්ත්‍රණය ලෙව්කේ විසින් මේජර් ඩේවිට් හට හෙළි කළ බව එච් .සී.පී බෙල් මහතා තම කෑගලු වාර්තාවේ සඳහන් කර තිබේ. ( Bell Report,1892,11). මෙකල නෝර්ත් විසින් රජු සමඟ ද ගිවිසුම් ඇති කර ගැනීමට නොයෙක්වර උත්සහ දරා තිබෙන අතර එය ලෙව්කේ හරහා සිදු කිරීම අපේක්ෂාව වී තිබේ(හේවාවසම්,අභය,2006,43-58). නෝර්ත් විසින් මැක්ඩොවල් තානාපතිවරයා හරහා යෝජනා පත්‍රයක් රජු වෙත එවූ අතර එය සලකා බැලීම ගන්නෝරුවේදී සිදු වී තිබේ. එහිදී රජු වෙනුවෙන් අදිකාරම්, ලෙව්කේ හා මාතලේ දිසාව සහභාගී වී තිබේ. මෙම සිංහල නිලධාරීන් තිදෙනා තානාපතිවරයාට පිළිතුරු ලබා දිය නොහැකි පරිදි බ්‍රිතාන්‍ය යුද රහස් ආදිය පිළිබඳව විමසීමට තරම් බුද්ධිමත් වූ බව කියවේ. මින් අනතුරුව ආණ්ඩුකාරවරයා ලෙව්කේ සමඟ මිත්‍රවීම වඩා යෝග්‍ය බව අවබෝධ කර ගන්නට ඇත. ලෙව්කේ වෙත රහස්‍ය ලිපියක් නෝර්ත් විසින් එව්වේයැයි සඳහන් විමෙන් එය තහවුරු වේ( හේවාවසම්,අභය,2006,43-58). නෝර්ත් විසින් උඩරට රජුගේ ආරක්ෂාව සැපයීම ඇතුලුව කරන ලද යෝජනාවලට තරයේ විරුද්ධවූවන් අතර ලෙව්කේ ද විය. මේවායින් පැහැදිළි වන්නේ ලෙව්කේ දැඩි රාජ්‍ය පාක්ෂික බවකින් හා නිර්භීතව ක්‍රියා කළ රාජ්‍ය නිලධාරියෙකු බවයි.

විදේශීය බලවේග විසින් උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට ගත් උත්සහයන් අසාර්ථක වීම කෙරෙහි උඩරැටියන්ගේ තිබූ එක්සත්භාවයත් සටන්කාමීත්වයත් ගරිල්ලා සටන් ක්‍රමය පිළිබඳ තිබූ නිපුණත්වයත් එයටම සරිලන පරිදි පිහිටි ස්වභාවික වනදුර්ග, ගිරිදුර්ග හා ජල දුර්ගවලින් යුතු වූ සතර කෝරළේ පරිසරයත් හේතු සාධක විය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේ ඉංග්‍රීසීන් කන්ද උඩරට ආක්‍රමණය කළ විටදී ලෙව්කේ දිසාව දේශානුරාගයෙන් රට මුදවා ගැනීමට ක්‍රියා කළ නායකයෙකි. 1803 දී ඇති වූ මෙම සටනේ නායකත්වය ගනු ලැබුවේ ලෙව්කේ මැතිඳුන්ය. මොහු උඩරට හමුදාවේ සේනාධිපති තනතුර දැරීය.

එතුමන් සතුරන් මඩින්නට මෙහෙය වූ සැටි ඉංග්‍රීසි සටනෙහි මෙසේ විස්තර වේ.

සිව් කෝරලේ රට - දෙවා ලෙව්කේ මැතිඳුට
රුපු වනසන ලෙසට - හැර වදාළේ එම දිසාවට
(වැලිගල රාළ, 1936,96)

මෙම සටනේ ජයග්‍රහණය ලැබීම හේතුවෙන් උද්දාමයට පත් වූ ලෙව්කේ රාළ විසින් ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වෙත යැවූ කවියක් පිළිබඳ ජන සාහිත්‍යයේ කියවේ.

කන්ද උඩරට ගන්න සගයන් ඇයිද මේ හැටි කැස කවන්නේ
බින්දහොත් ගල කන්ද උඩහට තොපිත් උඩරට රජ කරන්නේ
නන්දෙසින් පැන ආව ලන්දෙසි පරංගින් පැරැලා යන්නේ
තුංග බල සිව් කෝරලේ හමුදාව නිති රකින්නේ
( රණවීර,ධම්මික,2013.08,26, දිවයින,18)

මෙය ඉංග්‍රීසීන් වෙත පැහැදිලි කලා යැයි කියන්නේ තෝල්ක මුදලි විසිනි. කැප්ටන් ඩෝසන් විසින් කොළඹ සිට කන්ද උඩරට යා කෙරෙන මහාමාර්ගය ඉදිකිරීමත් කඩුගන්නාව ගල විදීම කෙරේ උනන්දු කළේද මෙම සිදුවීම විය හැකිය.

ඉංග්‍රීසීන් විසින් කළ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට ගංගා ගැලීම් හා වැස්ස ආදි ස්වභාවික සාධකද හේතු විය. මෙහිදී මේජර් ඩේවි අල්ලා ගැනීම හා ඔහුගේ සේනාව ඝාතනය කිරීම නිසා රජු හා සේනාව බල සම්පන්නව නැගී සිටින්නට උත්සාහ කෙරිණි. පසුව මොවුන් මුල් අවස්ථාවේදී තමා ලද ජයග්‍රහණය කෙරේ උද්දාමයට පත්ව පහතරට ප්‍රදේශ අල්ලා ගැනීමටද උත්සහ කෙරිණි. හංවැල්ල හා කොළඹ අල්ලා ගැනීම අරමුණ විය. මෙම සටන තිරිපොළ වෙල් යායේදී සිදු විය. මෙහිදී සිදු වූ සිදුවීම් පිළිබඳ ගෙතී ජනප්‍රවාද රැසකි.

එක් ජනප්‍රවාදයක එන පරිදි හංවැල්ල අල්ලා ගන්නට යන විටදී එහි කඳවුරු බැඳ ගෙන සිටියේ සුළු ඉංග්‍රීසි පිරිසකි. ලෙව්කේට එම පිරිස පළවා හැරීම එතරම් අපහසු කාර්යයක් නොවීය. ඒ නිසා ලෙව්කේ කලබලයට පත් වූයේ නැත. ඉංග්‍රීසීන් යටත් කර ගැනීමේ සැලැස්මක් මොහුට විය.මේ වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සටන නිරීක්ෂණය කිරීම සඳහා අසු පිටින් පෙරමුණට ගියේලු. ඒ අවස්ථාවේ රජුගේ කණ

සමීපයෙන් වෙඩිල්ලක් ගිය බැවින් රජු කලබලයට පත් විය. බේරී පළා යන රජුට කුරුම්බා ගෙඩියක් පානය කරමින් සිටි ලෙව්කේ දැක ගන්නට ලැබුණි. පලිපාන මොහොට්ටාලද ඒ සමීපයේ විය. යුද්ධ නොකර කුරුම්බා පානය කිරීම පිළිබඳ උදහස් වූ රජු මොවුන්ගේ හිස් ගසා දැමීමට අණ කළේලු.

ඇතැම් මූලාශ්‍රයවල මෙබඳු විස්තරයක් ඇතුළත් වේ. එනම් හංවැල්ල බලකොටුව අල්ලා ගැනීම සඳහා ගිය සේනාවේ නායකත්වය ලෙව්කේ සතු විය. එහි මුලින් ඉංග්‍රීසි හමුදාවේ සිටි ජා,කාපිරි, සිපයි වැනි කුලීකාර හමුදාවේ පිරිස් ද ඇතුළත් විය. සටන අවස්ථාවේදී මෙම හමුදා පිරිස් නැවත ඉංග්‍රීසීන්ට එක් විය.ඒ නිසා ඔවුන් නිසි පරිදි සටන් කළේ නැත. ඔවුන්ගේ සහය නොලැබීම නිසා සිංහලයන්ට ලැබීමට තිබූ ජයග්‍රහණය ගිලිහිණි. මේ වන විට රජු හා යුද්ධ මුලාදෑණීන් අතර බේදයක් ඇති කිරීමේ රහස් කුමන්ත්‍රණයක්ද ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව ලෙව්කේ හා පලිපාන මුදලි නිසි පරිදි සේනා සංවිධානය කළේ නැතැයි රජුට සැල විය. තවද ඉංග්‍රීසීන්ගෙන් අල්ලස් ගෙන සිංහල හමුදාවේ තුවක්කුවලට වෙඩි උණ්ඩ නොදැමූ බවට ප්‍රචාරය විය. රජු එන විට ලෙව්කේ කුරුම්බා බොමින් සිටීම නිසා ඔවුන්ට විරුද්ධව ගොඩ නැගුණු කුමන්ත්‍රණය සත්‍යයක් යැයි කෝපයට පත් රජු සිතන්නට ඇත. '' රජතුමණි මිනිත්තු පහකින් කොටුව අල්ලා දෙන්නම්'' යැයි ලෙව්කේ මෙහිදී කියා සිටියත් රජු දැඩි සේ කෝපයට පත්ව සිටි හෙයින් මොවුන්ගේ හිස ගසා දැමීමට අණ කළේලු( ඒකනායක,ඇකිරියගල2006ජ,23). ඒ අනුව ක්‍රි.ව 1803 සැප්තැම්බර් මස 06 වන දින මරණයට පත් කරන ලද බව ඩී.හේරත් චන්ද්‍රරත්න මහතා සඳහන් කර තිබේ(බණ්ඩාර,සිසිර කුමාර,2014.10.26,ලංකාදීප,06). මොහුගේ මරණය සම්බන්ධව ප්‍රසිද්ධ ජන කවක් සතර කෝරළ හා උඩරට ප්‍රදේශවල ජනප්‍රියව ඇත.

පුන්සඳ සේම පායාලා රට මැද්දේ
රන්කෙඳි සේම පීරාලා පිට මැද්දේ
මාර සෙනඟ වටකර ගෙන යම යුද්දේ
ලෙව්කේ මැතිඳු අද තනියම වෙළ මැද්දේ
( සතර කෝරළ විත්තිය, 1964 , 79 )

එක් අතකින් මෙහි ජීවිත අවබෝධයක්ද ඇත. මුල් පද දෙකෙන් ලෙව්කේගේ කඩවසම් තේජාන්විත බව නිරූපණය කරයි. අවසන් පද

දෙකෙන් මාරයා සමඟ කළ සටනත් නායකයෙකුව සිටියදී තමා වටා විශාල පිරිසක් සිටියද විපතට පත් වූ විටදී සියල්ල අතහැර ගොස් ඇති අයුරු විග්‍රහ කරයි. තවද රට වෙනුවෙන් සටන් කළ මොහු මිය යන්නේ සශ්‍රීකත්වයේ මූර්තියක් වූ වෙල මැදය. ලොව සියල්ල අස්ථිරය. බලය, ධනය, රූපය ආදී වූ සියල්ල මරණයට යටත් වන අයුරු මෙහි අපූරුවට විස්තර වන බව මා හැඟි අදහසයි. මෙහි උපහාසාත්මක බවක් මිසක අනුකම්පාසහගත බවක් නැතිවාද යන්න යමෙකුට සිතෙන්නකි.

මෙම දිසාවගේ මරණය සිහිකරනු වස් මෙම ගැටුම හා හිස ගසා දැමීමට පාදක වූ හංවැල්ලට ඔබ්බෙන් කළුඅග්ගල වරකාගොඩහි( කොළඹ-අවිස්සාවේල්ල පරණ මාර්ගය හා අලුත් මාර්ගය යාවෙන ස්ථානයෙහි) ස්මාරකයක් තනා තිබේ. එහි

" **වීරෝදාර සිංහල සෙනෙවියෙකු වූ ලෙව්කේ මහ දිසාවේ තුමා ඉංග්‍රීසීන් සමඟ දහනව වන සියවසේ මුල්දී හංවැල්ලේ බලකොටුව අභියස ජාතිය වෙනුවෙන් සටන් කොට දිවි පුදා ඉහත සඳහන්ජන කවියෙන් පොදු ජනයාගේ සිත්සතන් තුළ අමරණීය වීම සමරනු වස්"**

වශයෙන් සඳහන් වී තිබේ. ලෙව්කේගේ හිස ගසා දැමීමෙන් පසු ඔහුගේ ඉඩම් රාජ සන්තක කරන ලදී. එහෙත් ඉංග්‍රීසීන් මහනුවර රාජධානියේ පාලනය සියතට ගත් පසු ලෙව්කේගේ ජාතිහිතෛෂීභාවය සැලකිල්ලට ගනිමින් ඔහුගේ දියණියන් තිදෙනාට එම ඉඩම් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසින් පවරා දෙන ලදී (Peiris,P.E,176).

දෙවන ලෙව්කේ විවාහ වී සිටියේ දෙල්ගොඩ කුමාරිහාමි සමඟය. ඔවුන්ට සිටියේ දියණියන් තිදෙනෙකි. ඉන් දෙදෙනෙක් මාම්පිටිය සහෝදරයන් සමඟ විවාහ විය. වැඩිමහලු දියණිය වූ ලෙව්කේ ලොකු මැණිකා පළමුව රත්වත්තේ දේවමැද්දේ දිසාව සමගද දෙවනුව මොල්ලිගොඩ අදිකාරම් සමඟ ද තෙවනුව තල්ගහගොඩ කෝරාළ හා විවාහ විය(Peiris,P.E,24-26). ලෙව්කේගේ දරුවන් තිදෙනාටම දරුවන් සිටියේ නැත. මේ නිසා 1842 දී ලෙව්කේ සතු ඉඩම් තල්ගහගොඩ කෝරාළට පවරා දී තිබේ. පසුව ඔහුගේ සහෝදර තල්ගහගොඩ බණ්ඩාට අයිති විය. ඔහුට ලෙව්කේ ලොකු කුමාරිහාමි හා ටිකිරි කුමාරිහාමි නමින් දියණියන් දෙදෙනෙක් විය. මෙයින් පසු පිරිසිදු

ලෙව්කේ නාමය වෙනුවට තල්ගහගොඩ පරපුරේ පිරිස් ලෙව්කේ නාමය භාවිත කිරීම සිදු වී තිබේ.

ලෙව්කේ පරපුරෙහි පිරිස් විසින් මෙරට ශාසන විෂයෙහි කළ සේවාව ද ඉතා අගනා වූවකි. වෙහෙර විහාර බොහොමයක් ඉදිකළා පමණක් නොව ඒ හරහා අධ්‍යාපනික දියුණුවක් ද ඇති වීමට හේතු විය. යටදොළපහළ, ලෙන්දරමුල්ල, දණගිරිගල, වාකිරිගල හා දඹුල්ල වැනි විහාර මොවුන් විසින් ප්‍රතිසංස්කරණය කළ ඒවා අතරින් කිහිපයකි. එය සිහිකිරීම වස් දඹුල්ල, දණගිරිගල වැනි විහාරවල ලෙව්කේ රූපයන් විචිත්‍රවත් කර තිබේ. දඹුල්ල ගල් විහාරයට මහනුවර රාජ සභාවේ අණ පරිදි ක්‍රි.ව 1766 දී සන්නසක් මගින් ඉඩම් පූජා කර තිබේ (Bell,H.C.P,1892,11). එමෙන්ම මෙම ලෙව්කේවරයෙකු අතින් සිදු වූ වැදගත්ම කාර්යය නම් පිරුවානා පොත් වහන්සේ කරතොට ධර්මාරාම මාහිමියන් විසින් ලියවීමයි. ඒ පිළිබඳව ලියවී ඇති මුබ පරම්පරාගත කවියකින් එය සනාථ කරයි. ඒ මෙසේය.

ඇරයුම ලෙව්කේ මැතිඳුගේ ඉවසා කරතොට දම්රටි යතිඳුතුමා
නරයන හට වන දුබික් රෝගයන් බිය යන සැම දුරලන සේමා
අරමේ ගල් වඩුනාපායේ විසි දිනක් වැසා විදි පුද බෝමා
කරවිය පන්දහසක් පවතින්නට පිරුණා පොත ලියා නිමා

එමෙන්ම මොහු සාමාන්‍ය ජනයාගේ කටයුතු කෙරෙහිද මැදිහත් වී ක්‍රියා කළ යහපත් නිලධාරියෙකු ලෙස දක්වීමටද ජන කවියා උත්සහ කරයි. මොහු දිනක් අප්‍රසිද්ධියේම අවි ආයුධ තිපද වූ කම්හලකට ගිය සිදුවීමක් අළලා ගෙති ඇති ජන කවියකි.

සිරිදර රාජාධිරාජ සිහ එ නරපති
සිරිබර ගුණැති මැති රුවනකි ලෙව්කේ රුති
පිරිවර සමඟ සිව් කෝරළේ රකින මැති
ගිරි බර කිණිහිරේ කම්හල පවත්වති

බණ්ඩා,ජී.ආර්,''-'',221 )

මොවුන්ගේ වාසභවන වූ ලෙව්කේ වලව්ව සබරගමු පළාතේ ඇති වලව් අතරින් පැරණිතම වලව්ව ලෙස සැලකේ.

'' ලෙව්කේ ඒඳඩුවාව මොල්ලිගොඩ...................''

( සතර කෝරළ විත්තිය, 1964 ,77).

එම වලව්ව මාවනැල්ල ගල්අතර සුදුගලේ බෝධිය සමීපයේ පිහිටා තිබේ. මෙහි ලෙව්කේගේ පෞද්ගලික විහාරය ද දක්නට ලැබේ. එය සංස්කෘතික අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ප්‍රතිසංස්කරණය කර තිබීම අගය කළ යුත්තකි. විසිවන සියවසේදී මෙම වලව්ව රත්වත්තේ නිලමේ විසින් නවීකරණය කර තිබේ. මෙහි වසරක් පාසා කොහොඹා කංකාරි ශාන්ති කර්මය පවත්වා ගල්අතර නර්තන පරපුරට ත්‍යාග පිරිනැමීම ලෙව්කේගේ සිරිත විය (හේමපාල,නුවරඑළියේ,2003,24).

මේ අනුව සලකා බැලීමේදී පැහැදිලි වන්නේ ලෙව්කේ පරපුර විසින් මෙරට දේශපාලන හා ආගමික සංදර්භය තුළ දක්වූ දායකත්වය මත ඔවුන් සතර කෝරළ ඉතිහාසයට මෙන්ම ලංකා ඉතිහාසයට ඉතා වැදගත් වූ පරපුරක් බවයි. තවද දීර්ඝ කාලයක් පුරාවට ජීවත් වූ ලෙව්කේ නම් එක් අයෙකු ලෙස මූලාශ්‍රය ගණනාවක සඳහන් වී තිබුණද ඉහත දක් වූ කරුණු මත එළඹිය හැකි නිගමනය නම් ලෙව්කේ නම් එක් අයෙකු නොව ප්‍රධාන වශයෙන් ලෙව්කේවරු තිදෙනෙකු වූ බවයි. ඔවුන්ගේ දේශපාලන හා ආගමෙහි උන්නතිය සඳහා දක් වූ දායකත්වය සැලකීමේදී ලෙව්කේ පරපුර පිළිබඳව රචනා වී තිබීම ප්‍රමාණවත් නැති බව කිව යුතුය. දෙවන ලෙව්කේ උඩරට රාජ්‍ය ආරක්ෂාව සඳහා මුල සිට දක් වූ දායකත්වය දෙස බැලීමේදී ඔහු රාජ ද්‍රෝහියෙකු නොව උඩරට ප්‍රධානීන්ගේ කුමන්ත්‍රණ මත නිකරුණේ මැරුම් කෑ ජන ප්‍රධානියෙකු ලෙස සැලකීම සුදුසු බවද මෙහිලා සඳහන් කළ යුතුය.

## ආශ්‍රේය ග්‍රන්ථ


- ඇකිරියගල,ගොඩගේ,2006, ***රාජසිංහ පුවත,*** කොළඹ.
- ජයකොඩි, දයාවංශ, 2002, ***සිංහලේ ජාතික සටන්***, කොළඹ.
- දැරණියගල,ප.එ.ල,2005,***සිංහල ත්‍රාසජනක ක්‍රීඩා***, කෞතුකාගාර දෙපාර්තමේන්තුව.
- දේවරාජ,ලෝනා,අබයසිංහ හා තවත්,1977, ***උඩරට රාජධානිය***, කොළඹ.
- ධම්මික,රණවිර,2014.03.12, ***''බින්දහොත් ගල කන්ද උඩහට තොපිත් උඩරට රජ කරන්නේ''***, දිවයින.
- වාචිස්සර හිමි,කොටගම, 1964, ***සරණංකර සංඝරාජ සමය***, බොරලැස්ගමුව.

- බණ්ඩාර,සිසර කුමාර, 2014.10.26, ***"ලෙව්කේ පරපුර"***, තක්සලාව, දිවයින.
- බණ්ඩා, ගුණවර්ධන, "-", ***ඓතිහාසික හා සාහිත්‍ය විමර්ශන***, කොළඹ.
- බණ්ඩා, ගුණවර්ධන,එදිරිසිංහ.ඊ.ජ්.ජ්, 2002, ***කෑගලු චිත්ති***, කෑගල්ල.
- බෙල්.එච්.සී.පී, (පරි.) එඩ්මන්ඩ්,කේ.බී.ජ්, 2004,***කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව***,කොළඹ.
- පීරිස්,පෝල්,2006,(පරි.) හේවාවසම්,අභය,***ත්‍රී සිංහලේ***,කොළඹ.
- මාර්ෂල්,හෙන්රි, 2004, ***සිංහලේ***, (අනු.) සෝමරත්න,එච්.එම්, බොරලැස්ගමුව.
- සිද්ධාර්ථ හිමි, රඹුක්වැල්ලේ,(1964), ***"මහනුවර රජවාසල අන්තිම කාලය"***,විද්‍යෝදය සඟරාව, 1 කලාපය,ජයවර්ධනපුර.
- හේමපාල, නුවරඑළියේ, 2003, **ත්‍රී සිංහලේ නායකයෝ**, මුල්ලේරියාව
- Dr.De Silva,P.H.D.H, 1988,***A Catalogue Of Antiquary And Other Cultural Objeccts From Sri Lanka Abroad,***Colombo.
- Gideon,Joan, 1935,***Memoir of Loten***, Colombo.
- Lewis,J.P, 1976,***" Kandy Notes"*** The Ceylon Antiquary And Literary Register,Vol.VI,Part IV, Colombo.
- Peiris,P.E, 1950,***Sinhale And The Patriots***, Colombo.
- ***Report on the Kegalle District of the Province of Sabaragamuwa***, 1892, Bell,H.C.P, Colombo.
- R.De Silva, Colvin, 1976,***Ceylon Under British Occupation***,Colombo.